# 1.29 නූතන සම්මත හින්දී භාෂාවේ මධ්‍යම පුරුෂ සර්වනාම භාවිතය පිළිබඳ අධ්‍යයනයක්: ලේඛනයට හා භාෂණයට අදාළව

උපුල් රංජිත් හේවාවිතානගමගේ
හින්දි අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

කිසියම් භාෂාවක භාවිතය වඩාත් අර්ථවත් කර ගත හැකිව ඇති අති විශේෂ අංගයක් වන්නේ එම භාෂාවට අයත් සර්වනාමයෝ ය. භාෂාවේ දී සර්වනාමයන්හි භූමිකාවට ප්‍රධානත්වය නොදී කටයුතු කිරීමට කිසිවකුට හැකියාවක් නැත. කිසියම් භාෂාවක භාවිත මානව-අමානව නාම, වස්තු නාම ආදිය වෙනත් ඕනෑම භාෂාවකට යොදා ගත හැකි වූවත්, කිසියම් භාෂාවක සර්වනාම වෙනත් භාෂාවකට සම්බන්ධ කරමින් භාවිත කිරීම අසීරුය. එබැවින් භාෂාවක දී සර්වනාමවල භූමිකාව සුවිශේෂී වේ.

නූතන සම්මත හින්දී භාෂාව හා සම්බන්ධයෙන් සැලකීමේ දී ව්‍යාකරණ ග්‍රන්ථවල දක්වා ඇති මධ්‍යම පුරුෂ සර්වනාම, භාවිතයේ දී සැලකිය යුතු වෙනස්කම් සහිතව මෙන් ම, සමහර අවස්ථාවල දී සම්පූර්ණයෙන් ම වෙනස් ආකාරයට හැසිරෙනු දක්නට ලැබෙයි. ජීව භාෂාවක් නිරන්තරයෙන් ම පරිණාමයට භාජනය වීම ස්වභාවික ය. එහෙත්, එම වෙනස් වීම් ලේඛනගත වීම හෙවත් වෙසෙසින් ම ව්‍යාකරණ ග්‍රන්ථවලට ඇතුළත් වීම විටෙක ඉක්මනින් ම සිදු වන අතර, විටෙක ඒවා බොහෝ කාලයක් ගත වීමෙන් පසුව සිදු වෙයි.

මෙහි දී මූලික ව සලකා බැලෙන්නේ නූතන සම්මත හින්දී භාෂාවේ මධ්‍යම පුරුෂ සර්වනාම භාවිතයෙහි ඇති වී තිබෙන වෙනස්කම් ය. එමෙන් ම, ව්‍යාකරණ ග්‍රන්ථවල දැක්වෙන මධ්‍යම පුරුෂ සර්වනාම සහ ඒවා භාවිතයෙහි දී දෙවන භාෂාවක් ලෙස හින්දී භාෂාව හදාරන විද්‍යාර්ථීන්ට ගැටලු රැසකට මුහුණ දීමට සිදු වෙයි. එම ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා කිසියම් ක්‍රමවේදයක් අත්‍යවශ්‍ය ය. මෙම විමර්ශනයේ අරමුණ වී ඇත්තේ දෙවන භාෂාවක් ලෙස හින්දී හදාරන විද්‍යාර්ථීන්ට පහසුවෙන් හා නිවැරදිව හින්දියේ මධ්‍යම පුරුෂ සර්වනාම භාවිත කිරීමට අවශ්‍ය වන නිවැරදි ව්‍යාකරණ විග්‍රහයක් සහිත ක්‍රමවේදයක් සකස් කර දීම ය.